

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ஆண்டிற்கான செயற்திறன் அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2021

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்

Land Commissioner General's Department

පටුන

පිටු අංක

1. පරිච්ඡේදය - ආයතන පැතිකඩ **4- 7**

1.1 හැඳින්වීම

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **8- 11**

2.1 ප්‍රගතිය

2.2 විශේෂ වැඩසටහන්

2.3 ඉදිරි ඉලක්ක

3. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය **12- 18**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

3.6 මු.රෙ. 208 ප්‍රකාරව දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

4. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක **19**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය **20**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ **21 - 22**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2 මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය

6.3 මානව සම්පත් සංවර්ධනය

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව **23 - 28**

1. පරිච්ඡේදය
ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත, රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යන පනත් මගින් රජයේ ඉඩම් හා සම්බන්ධ ඉඩම් කච්චේරි පැවැත්වීම, අඩු ආදායම්ලාභී පුද්ගලයන් වෙත නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබා දීම, බලපත්‍ර ලබා දීම, දීමනා පත්‍ර ලබා දීම ආදී කටයුතු මෙන්ම වැඩි ආදායම් පුද්ගලයන් සහ විවිධ ආයතන වෙත ද කෘෂිකාර්මික සහ වාණිජමය ආදී අවශ්‍යතාවයන් සඳහා දීර්ඝකාලීන බදු කර මෙන්ම නිදහස් දීමනාපත්‍ර ලබා දීම, රජයේ ඉඩම් බැහැර කිරීමේ දී කටයුතු කිරීමට අදාළ රාජකාරී යනාදී කටයුතු රාශියක් මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදු කරනු ලබයි.

1.2 දෙපාර්තමේන්තු දැක්ම

"රාජ්‍ය ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස නිරවුල් බිමක් හිමි සමාජයක් බිහිකිරීම"

1.2.1. මෙහෙවර ප්‍රකාශය

"ජාතික ප්‍රතිපත්තියක් තුල මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනයේ චිරස්ථායී බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමට මහ පෙන්වමින් නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරීත්වයක් පවත්වා ගෙන යෑම"

1.2.2. දෙපාර්තමේන්තුවේ අරමුණු හා උපාය මාර්ග

අරමුණු	උපාය මාර්ග
1 ඉඩම් නොමැති ප්‍රජාවගේ ඉඩම් භුක්තිය ශක්තිමත් කිරීම.	i ඉඩම් හිමිකම තහවුරු කිරීම. ii රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු කළමනාකරණය කිරීම.
2 ආයෝජන අවස්ථා පුළුල් කිරීම.	i ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා රජයේ ඉඩම් උපයෝජනය කිරීම.
3 රජයේ ඉඩම් ප්‍රශස්ථ භාවිතය.	i රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් සංවර්ධනය කිරීම. ii රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම.
4 දෙපාර්තමේන්තුව සතු සම්පත් ප්‍රශස්ථව කළමනාකරණය කිරීම .	i මානව සම්පත සංවර්ධනය කිරීම. ii භෞතික සම්පත ඵලදායී ලෙස භාවිතා කිරීම. iii මූල්‍ය සම්පත විධිමත්ව කළමනාකරණය කිරීම.
5 රාජ්‍ය ආදායම වර්ධනය කිරීමට දායකවීම	i ඉඩම් ආදායම් හඳුනාගැනීම හා ඇස්තමේන්තු කිරීම ii ඉඩම් ආදායම් කාර්යක්ෂමව හා විධිමත්ව රැස්කිරීම. iii හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල පියවර ගැනීම.

1.3 රජයේ ඉඩම් පරිපාලනය තුල ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

ඉඩම් කළමනාකරණයේ ප්‍රමුඛයා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව රජයේ ඉඩම් බැහැර කිරීමේදී පහත සඳහන් සුවිශේෂී වූ කාර්ය භාරයන් ඉටුකරනු ලබයි.

01. අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණය කිරීම.
02. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම හා බෙදා දුන් ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීම.
03. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බෙදාදීම, මේ යටතේ
    - නිවාස, කෘෂිකාර්මික, කර්මාන්ත හා වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීම.
    - විශේෂ හා නිදහස් දීමනා පත්‍ර නිකුත් කිරීම.
    - විහාරස්ථාන සඳහා පූජා භූමි ඔප්පු නිකුත් කිරීම.
    - රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කිරීම, බදු දීම හා පැවරීම.
04. ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩම් බෙදාදීම හා දීමනාපත්‍ර නිකුත් කිරීම.
05. රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ රජයේ ඉඩම් හා රක්ෂිත ආරක්ෂා කිරීම
06. අන්තර් පළාත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘති වලින් බැහැර රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දීම.
07. රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණය කිරීම.
08. රාජ්‍ය බදු ආදායම් ශක්තිමත් කිරීමට රජයේ ඉඩම් මත බදු අයකර ගැනීම කළමනාකරණය කිරීම.
09. මානව සම්පත් සංවර්ධන කටයුතු පවත්වා ගෙනයාම.
10. ඉඩම් ආරවුල් නිරාකරණය කිරීම.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන



සුවිය

- **නි.ඉ.කො.** - **නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්**
- **ස.ඉ.කො.** - **සහකාර ඉඩම් කොමසාරිස්**
- **පරි.නි.** - **පරිපාලන නිලධාරී**
- **ජ්‍යෙ.වැ.අධි.** - **ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරී**
- **භාෂා පරි.** - **භාෂා පරිවර්තක**

1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රාදේශීය කාර්යාල

මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් සම්බන්ධ රාජකාරී කටයුතු ප්‍රධාන කාර්යාලයට අමතරව අන්තර් පළාත් වාරිමාර්ග ක්‍රම යටතේ පිහිටුවා තිබෙන්නා වූ ඉඩම් කොමසාරිස් කාර්යාල 06 ක් සහ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල 02 ක් යටතේද සිදු කරනු ලබයි.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන පිළිබඳ තොරතුරු පහතින් දැක්වේ.

1. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - අනුරාධපුරය
2. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - පොළොන්නරුව
3. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - අම්පාර
4. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - ත්‍රිකුණාමලය
5. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - දෙබරවැව
6. ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - මහියංගණය
7. සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - කන්තලේ
8. සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කාර්යාලය - මොණරාගල

1.5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඉඩම් අංශය I, ඉඩම් අංශය II, ඉඩම් අංශය III, පාලන අංශය, ගිණුම් අංශය හා අභ්‍යන්තර විගණන අංශය වශයෙන් අංශ 06 ක් ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාත්මක වේ. මෙයින් ඉඩම් අංශ තුනෙහි හා පාලන අංශයේ ප්‍රධානීන් ලෙස ඉඩම් කොමසාරිස්වරු කටයුතු කරනු ලබන අතර ගිණුම් අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන ගණකාධිකාරි ද, අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක ද කටයුතු කරනු ලැබේ.

2. පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

මූලික වගකීම	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කර ඇති ප්‍රධාන කාර්යයන්	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන පරිදි ප්‍රමුඛ කාර්යසාධක දර්ශකය	ප්‍රගතිය
ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් I, II, III, ප්‍රාදේශීය කාර්යාල, පළාත් ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම්	**1.1 ගොවි ප්‍රජාව, අඩු ආදායම්ලාභීන් හා ව්‍යාපාරිකයන් උදෙසා ඉඩම් බැහැර කිරීම.**		
	1.1.1 ඉඩම් නොමැති පුද්ගලයින් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කච්චේරි අනුමත කිරීම	1500	10806
	1.1.2 ඉඩම් නොමැති පුද්ගලයින් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම	60000	35005
	1.1.3 ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම	30250	9230
	1.1.4 දීමනාපත්‍ර පසු කටයුතු (පසු උරුමය නම් කිරීම, මුල් අයිතිය සහතික කිරීම, දීමනාපත්‍ර බැහැර කිරීම, උකස් කිරීම, කොන්දේසි ලිහිල් කිරීම)	5000	3772
	1.1.5 මධ්‍යම පාන්තික දීමනාපත්‍ර සකස් කිරීම	250	83
	1.1.6 ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර හා දීමනා පත්‍ර ගැටළුවලට උපදෙස් ලබාදීම හා ගැටළු නිරාකරණය	15000	11896
	1.1.7 ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම	500	105
	1.2 රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කටයුතු සිදු කිරීම		
	1.2.1 රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බදු දීම සඳහා කච්චේරි අනුමත කිරීම	92	57
	1.2.2 රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බදු නිර්දේශ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම	5000	7130
	1.2.3 රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදුකර සකස් කිරීම	7000	758
	1.2.4 නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම	1050	1136
	1.2.5 දීමනාපත්‍ර/ දීර්ඝකාලීන බදු/ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව ලියාපදිංචිය (බිම් සවිය)	10000	391
	1.3. රාජ්‍ය/ අර්ධ රාජ්‍ය/ විහාරස්ථාන/ සමිති හා අනෙකුත් ආයතනවලට ඉඩම් බැහැර කිරීම.		
	1.3.1 දෙපාර්තමේන්තුවලට ඉඩම් නිදහස් කිරීම	1200	1237
	1.3.2 ත්‍රිවිධ හමුදා හා පළාත් පාලන ආයතන සඳහා පැවැරුම් නියෝග නිකුත් කිරීමට අමාත්‍යාංශ නිර්දේශ යැවීම	100	240
	1.3.3 බෞද්ධ විහාරස්ථාන	200	171
	1.3.4 අනෙකුත් ආගමික සිද්ධස්ථාන	60	2
	1.3.5 නාගරික සංවර්ධන අධිකාරිය / ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	60	60
	1.3.6 සමිති/ සංවිධාන	40	8

	1.3.7 සුනාමි දිමනාපත්‍ර සකස් කිරීම	300	363
	1.3.8 රජයේ ඉඩම් ආඥා පනත යටතේ උපදෙස් ලබාදීම	9000	14708
	1.4. ඉඩම් ප්‍රදාන විශේෂ විධි විධාන පනත යටතේ නියාදන සාදන දීමනාපත්‍ර සකස් කිරීම	200	77

2.2 විශේෂ වැඩසටහන්

2.2.1 බිම්සවිය වැඩසටහන

බිම්සවිය වැඩසටහන ඉඩම් අමාත්‍යාංශය හා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූලික දායකත්වයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 65 ක් තුළ ක්‍රියාවට නංවන ලද ඉඩම් සඳහා හිමිකම් සහතික ලබා දීමේ ජාතික වැඩසටහනක් ලෙස හඳුන්වා දිය හැක.

මේ අනුව රජයේ ඉඩම් සඳහා මෙම වැඩසටහන යටතේ 2021 වර්ෂය අවසානය දක්වා බලපත්‍ර 116 ක් ද, කැඩැස්තර සිතියම් යටතේ දීමනාපත්‍ර සංඛ්‍යාව 107 ක් ද නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත. ඉඩම් කච්චේරි 177 ක්, ජංගම සේවා 2 ක් හා කොට්ඨාශ දින 25 ක් ද පවත්වා ඇත. ඊට අමතරව ඉඩම් ගැටළු 1282 ක් සඳහා උපදෙස් ලබා දී ඇත.

2.2.2 රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම

රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (State Land Information Management System) නිර්මාණය කිරීමට කටයුතු කර ඇත. රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු සිදු කරන අතර ඉඩම් බෙදාදී ලියකියවිලි නිකුත් කිරීම හා ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියද බෙදා දුන් ඉඩම් වලට අදාළ පසු කටයුතු හා අධීක්ෂණ කටයුතු ද මෙම පද්ධතිය මඟින් සිදු කිරීමට හැකියාව ඇත. 2013 වර්ෂයේ දී බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 40 කින් ආරම්භ වූ මෙම වැඩ සටහන 2021 වර්ෂය අවසන් වන විට දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 332 හිම සාර්ථකව ක්‍රියාවට නැංවීමට හැකි විය.

වර්ෂය	2019	2020	2021
ඉඩම් ලේඛන ඇසුරින් තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම් (ලේඛණ සංඛ්‍යාව)	144,936	63,955	62,785
අනුරේඛණ සහිතව ඉඩම්වල ක්ෂේත්‍ර තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම් (ඉඩම් කැබලි සංඛ්‍යාව)	34,615	90,337	15,973
නව දීමනා පත්‍ර ලබාදීම	5,665	4,195	7,414
බලපත්‍ර සංඛ්‍යාව		115	484
දීර්ඝ කාලීන බදුකර සකස් කිරීම		11	75

2021 වර්ෂය තුල රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියට ඉඩම් ලේඛන 100,000 ක් ඇතුලත් කිරීමට ඉලක්ක කර, ලේඛණ 62,785 ක් ඇතුලත් කිරීමට දෙපාර්තමේන්තුව සමත් විය. මීට අමතරව මෙම වර්ෂයේදී ද දීමනාපත්‍ර, වාර්ෂික අවසරපත්‍ර, දීර්ඝ කාලීන බදුකර ආදී සියලු ලේඛණ මෙම පද්ධතිය උපයෝගි කර ගනිමින් මුද්‍රණය කිරීම සිදුකර ඇත. ඒ අනුව දීමනාපත්‍ර පමණක් 7,414 ක් නිකුත් කිරීමට හැකි වුණි. මෙම වර්ෂය තුළ රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන යටතේ පුහුණු වැඩසටහන් 25 පවත්වන ලද අතර පුහුණුව ලැබූ නිළධාරීන් සංඛ්‍යාව 1086 කි.

රජයේ ඉඩම් තොරතුරු හා කළමණාකරණ පද්ධතිය තවදුරටත් ක්‍රියාත්මක කිරීම

දිවයින පුරා සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

විස්තරය	2022 වර්ෂය සඳහා ඉලක්ක
බලපත්‍ර නිකුත් කිරීම	5,000
දීමනාපත්‍ර නිකුත් කිරීම	12,000
රජයේ ඉඩම් කැබලි පිළිබඳ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම	100,000

2.2.3 රජයේ ඉඩම් තොරතුරු රැස්කිරීමේ වැඩසටහන

රජයේ ඉඩම් කළමනාරණයේ පූර්ණ වගකීම මෙම දෙපාර්තමේන්තුව සතු බැවින් ආර්ථික සංවර්ධනයට අවශ්‍ය රජයේ ඉඩම් කඩිනමින් අදාළ පාර්ශව වෙත මුදාහැරීමත්, ඌන උපයෝජිත රජයේ ඉඩම් පූර්ණ උපයෝජනයට ලක් කිරීමට අවශ්‍ය ක්‍රමවේද සැකසීමත්, මෙම දෙපාර්තමේන්තුව සතු වගකීම් වේ. එබැවින් රජයේ ඉඩම් විධිමත්ව හඳුනාගැනීම හා විධිමත් රජයේ ඉඩම් තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම උක්ත වගකීම් ඉටු කිරීමේදී ඉමහත් පිටුවහලක් වේ. ඒ අනුව එම අරමුණ පෙරදැරිව මුළු දිවයිනම ආවරණය වන පරිදි ඉඩම් තොරතුරු රැස්කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදන ලදි. 2020 ඔක්තොම්බර් මස දී ආරම්භ වීමට නියමිතව තිබූ උක්ත වැඩසටහන නොවැලැක්විය හැකි හේතුවක් මත කල් දැමීමට සිදුවූව ද, 2020 දෙසැම්බර් මස දී එම වැඩසටහන ආරම්භ කරන ලදි. ග්‍රාම නිළධාරි වසම් මට්ටමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත වූ අතර 2021 වර්ෂය පුරා පැවති කොරෝනා අවදානම හේතුවෙන් එම වැඩසටහන අකර්මන්‍ය විය. කෙසේ වෙතත් උක්ත වැඩසටහන 2022 ඔක්තොම්බර් 31 දිනෙන් අවසන් වීමට නියමිත අතර, රැස්කරනු ලබන සියලුම දත්ත පරිගණක ගත දත්ත පද්ධතියකට ඇතුළත් කිරීමට සැලසුම් කර ඇත.

2.3 ඉදිරි ඉලක්ක

2.3.1. 2022 වර්ෂයේදී ඉටු කිරීමට අපේක්ෂිත අනෙකුත් කාර්යන්ගේ ඉලක්ක පහතින් දක්වා ඇත.

අනු අංකය	විස්තරය	2022 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක
01.	බදු ආදායම් රැස්කිරීම	රු.මිලි. 5000
02.	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම	15,000
03.	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම	30,000
04.	රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදු නිර්දේශ සකස් කිරීම	5,000
05.	රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදුකර සකස් කිරීම	1,500
06.	සුනාමි දීමනාපත්‍ර සකස් කිරීම	300
07.	දෙපාර්තමේන්තුවලට ඉඩම් නිදහස් කිරීම	1,000
08.	පැවරුම් නියෝග ලබා දීම	100
09.	ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන) පනත යටතේ නියාදන සාදන පත්‍ර සකස් කිරීම	100
10.	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මධ්‍යම පාන්තික දීමනාපත්‍ර සකස් කිරීම	100
11.	පූජා භූමි දීමනාපත්‍ර සකස් කිරීම	50
12.	ජංගම සේවා පැවැත්වීම	100

.....

ආයතන ප්‍රධානී

නම: ජී.ඩී.කීර්ති ගමගේ

තනතුර:ඉඩම් කොමසාරිස් ජනරාල්

දිනය: 2022.02.22

3. පරිච්ඡේදය

වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2021		සටහන	තත්‍ය 2021	තත්‍ය 2020	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	**1**			
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**			**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**			
100,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	105,312,901	105,011,391	
100,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**105,312,901**	**105,011,391**	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		292,183,200	286,429,000	**ඒසීඒ-3**
-	තැන්පතු		8,811,585	6,215,212	**ඒසීඒ-4**
15,200,000	අත්තිකාරම් ගිණුම්		21,790,178	18,014,196	**ඒසීඒ-5/5(ඒ)/5(බී)**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
15,200,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**322,784,962**	**310,658,408**	
115,200,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**428,097,864**	**415,669,799**	
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)**		32,693	7,509.00	
115,200,000	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)**		**428,065,170**	**415,662,290.00**	

	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
378,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	371,791,733	363,888,827	
114,800,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	79,876,964	78,814,682	**ඒසිඒ-2(ii)**
2,104,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,555,146	1,966,974	
-	පොළී ගෙවීම්	**8**	-	-	
596,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	595,656	1,027,936	
495,500,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**453,819,499**	**445,698,419.00**	
	මූලධන වියදම්				
32,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	23,066,084	17,767,822	
106,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	19,117,255	14,362,681	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
2,000,000	හැකියා වර්ධනය	**14**	372,250	455,470	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
140,000,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**42,555,588**	**32,585,973.00**	
	තැන්පතු ගෙවීම්		7,690,490	6,698,007	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		25,056,882	16,864,324	**ඒසිඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
-	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**32,747,372**	**23,562,331**	
635,500,000.00	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		529,122,460	501,846,722	
(520,300,000.00)	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(101,057,289)**	**(86,184,432)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		-	-	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසිඒ-3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	**2020**
	-	රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,819,354,547	1,816,218,897
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	67,076,308	63,809,604
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		
මුළු වත්කම්		**1,886,430,855**	**1,880,028,501**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(1,718,624)	(3,864,233)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,819,354,547	1,816,218,897
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	68,794,931	67,673,837
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		
මුළු වගකීම්		**1,886,430,854**	**1,880,028,501**

පිටු අංක 5 සිට 47 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 53 සිට 64 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.



3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය **ඒසීඒ-සී**

	2021 රු.	තත්‍ය 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	14,903,742	11,396,791.00
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	13,223,585	11,718,580.00
අග්‍රිම ලැබීම්	292,183,200	286,429,000.00
අත්තිකාරම් අයකර ගැනීම්	14,438,521	11,458,799.00
තැන්පතු ලැබීම්	8,811,585	6,215,212.00
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**343,560,632**	**327,218,382**

අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	271,531,234	266,934,656
සහනාධාර සහ මාරුකිරීම්	1,070,209	1,294,942
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,546,660	11,477,695
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	32,693	7,509
අත්තිකාරම් ගෙවීම්	17,969,486	12,089,423
තැන්පතු ගෙවීම්	7,690,490	6,698,007
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**301,840,773**	**298,502,232**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**41,719,859**	**28,716,150**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	41,719,859	28,716,150
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**41,719,859**	**28,716,150**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(41,719,859)**	**(28,716,150)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-

විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	**0**	**0**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**0**	**0**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**0**

3.4 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.03	ඉඩම් හා අනෙකුත් බදු කුලී	100,000	100,000	105,312	105.31%

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	495,000	470,683	453,820	96.42%
ප්‍රාග්ධන	140,000	61,700	42,556	68.97%

3.6 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ දිස්ත්‍රික් ලේකම්	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ප්‍රතිශතය
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ඉඩම් අමාත්‍යාංශය 122-1-3-1302	PABX, විදුලි සෝපානය හා මධ්‍යම වායු සමීකරණ නඩත්තුව	498.74	498.74	498.74	100%
	430-1-2-1302		115.61	115.61	115.61	100%
2	ඉඩම් භිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව 287-2-1-0-1302	ජෙනරේටරය,PABX, විදුලි සෝපාන, මධ්‍යම වායු සමීකරණ නඩත්තුව රෝනියෝ කඩදාසි මිලට ගැනීම	659.71	659.71	659.71	100%
	287-2-1-0-1201		295	295	295	100%
3	රාජ්‍ය සේවා, පළාත් සභා පළාත් පලාන අමාත්‍යාංශය 130-01-02-0-1003	සංවර්ධන නිලධාරී දීමනා	320	320	311.66	97.39%

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2021 වර්ෂයට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ප්‍රාදේශීය කාර්යාලවලින් ලැබෙමින් පවතියි.	936,104.5		
9152	යන්ත්‍රෝපකරණ		121,865.9		
9153	ඉඩම්		761,393.9		

9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-		
9160	කෙරීගෙන යන වැඩ		-		
9180	බදු දෙන ලද වත්කම්		-		

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇමුණුම I මගින් දක්වා ඇත.

4. පරිච්ඡේදය
ආයතනයේ කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කච්චේරි 1500 ක් පැවැත්වීම	100%		
ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර 60,000 ක් සකස් කිරීම.			58%
ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර 30250 ක් සකස් කිරීම			66%
ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනා පත්‍ර පසු කටයුතු 5000 ක් ඉටු කිරීම		75%	
මධ්‍යම පාන්තික දීමනාපත්‍ර 250 ක් ලබාදීම			62%
ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ දීමනාපත්‍ර 200 ක් ලබාදීම			39%
රජයේ ඉඩම් ආඥා පනත යටතේ කච්චේරි 92 ක් පැවැත් වීම			62%
රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් බදු නිර්දේශ 5000 ලබාදීම	100%		
රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදුකර 7000 නිකුත් කිරීම			42%
නිදහස් දීමනා පත්‍ර දීමනාපත්‍ර 1050 ක් ලබාදීම	100%		
ත්‍රිවිධ හමුදා හා පළාත් පාලන ආයතන සඳහා පැවැරුම් නියෝග 100 ක් සඳහා නිර්දේශ යැවීම	100%		
දෙපාර්තමේන්තු වලට ඉඩම් 1200 ක් නිදහස් කිරීම	100%		
සුනාමි දීමනාපත්‍ර 300 ක් ලබාදීම	100%		
පූජාභූමි දීමනාපත්‍ර 200 ක් ලබාදීම		86%	
UDA / NHDA දීමනාපත්‍ර 60 ක් ලබාදීම	100%		
ඉඩම් බලපත්‍ර හා දීමනා පත්‍ර ගැටළු 9,000 ක් සඳහා උපදෙස් ලබාදීම	100%		
රජයේ ඉඩම් තොරතුරු කලමනාකරණ පද්ධතිය මගින් බලපත්‍ර 2,000 ක් සකස් කිරීම			24%
රජයේ ඉඩම් තොරතුරු කලමනාකරණ පද්ධතිය මගින් දීමනා පත්‍ර 10,000 ක් සකස් කිරීම			74%
රජයේ ඉඩම් තොරතුරු කලමනාකරණ පද්ධතිය මගින් ඉඩම් කැබලි 100,000 ක තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම			63%
ජංගම සේවා වැඩසටහන් 500 පැවැත්වීම			21%
මානව සම්පත් සංවර්ධනය කිරීම යටතේ පළාත් හා ප්‍රාදේශීය වැඩමුළු පැවැත්වීම 34			18%

5. පරිච්ඡේදය
තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
(තිරසාර සංවර්ධන අරමුණු 1.4) විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙලෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියළුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපල උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම	බලපත්‍ර 60,000 ක් සකස් කිරීම.		58.34%	
	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම	දීමනාපත්‍ර 30,250 ක් සකස් කිරීම		65.80%	

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2021 වර්ෂයේ දී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 60,000 ක් වූ අතර ප්‍රගතිය 35,005 ක් විය. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 30,250 ක් වූ අතර ප්‍රගතිය 9,230 ක් විය. එමෙන්ම රාජ්‍ය ඉඩම් තොරතුරු හා කළමනාකරණ පද්ධතිය ඔස්සේ බලපත්‍ර සකස් කිරීමේ ඉලක්කය 2,000 ක් වූ අතර ප්‍රගතිය 484 ක් සහ දීමනා පත්‍ර සකස් කිරීමේ ඉලක්කය 10,000 ක් වූ අතර ප්‍රගතිය 7,414 ක් විය.

2021 වර්ෂයේ දී පැවති වසංගත තත්වය හේතුවෙන් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සකස් කිරීම හා දීමනාපත්‍ර සකස් කිරීම සඳහා වර්ෂය මුල දී සැලසුම් කරන ලද ඉලක්කයට ලඟා වීමට තරමක් අපහසු විය.

6. පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	කොන්ත්‍රාත් පදනම මත	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	53	35	2	18
තෘතීක	38	5	2	33
ද්විතියික	674	488	7	186
ප්‍රාථමික	140	92	1	48

- ජ්‍යෙෂ්ඨ මට්ටම යටතේ පවතින තනතුරු නාම ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස්, ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර ඉඩම් කොමසාරිස්, ගණකාධිකාරි, මිනින්දෝරු, නීති නිලධාරි තනතුරු ඇතුළත් වේ.
- තෘතීක මට්ටම යටතේ පවතින තනතුරු නාම ලෙස පරිපාලන නිලධාරී, ජනපද නිලධාරී (විශේෂ), ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි, භාෂා පරිවර්තක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරු ඇතුළත් වේ.
- ද්විතියික මට්ටමේ පවතින තනතුරු ලෙස සංවර්ධන නිලධාරී, වැඩ අධිකාරි, ජනපද නිලධාරි, සැලසුම් ශිල්පි, කළමනාකරණ සේවා නිලධාරි, ක්ෂේත්‍ර උපදේශක, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර, ලේඛන භාරකරු තනතුරු ඇතුළත් වේ.
- ප්‍රාථමික මට්ටම යටතේ පවතින තනතුරු ලෙස රියදුරු, මෝටර් කාර්මික, කාර්යාල කාර්ය සහායක, කාර්යාල කම්කරු, සංචාරක බංගලා භාරකරු, සංචාරක බංගලා කම්කරු, මැනුම් සහායක, ගබඩාකරු, මුරකරු යන තනතුරු ඇතුළත් වේ.

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපෑ ආකාරය

ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇතත් සියළු පුරප්පාඩු පුරවාගත නොහැකි වී ඇත. එමෙන්ම දෙපාර්තමේන්තුගත පත්කිරීම්වල ද සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් පවති. එබැවින් ඉඩම් කොමසාරිස්, වැඩ අධිකාරි, ජනපද නිළධාරි හා සංචාරක බංගලා භාරකරු යන තනතුරු වල පුරප්පාඩු මේ වනවිට සම්පූර්ණ කරගත නොහැකි වීම හේතුවෙන් ඇතැම් සේවාවන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් යම් ප්‍රමාණයකගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත.

දෙපාර්තමේන්තුවේ දැනට සිටින නිලධාරීන් අතර දෙපාර්තමේන්තුවට අයත් රාජකාරී ප්‍රමාණය බෙදීයාම හේතුවෙන් නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය, ඵලදායීතාවයට යම් බලපෑමක් ඇති වන අතර, මෙම මානව සම්පත් හිඟය මඟ හරවා ගත හැකි නම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය තවදුරටත් ඉහළ නැංවීමට ඉවහල්වනු ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණුවලත් නිලධාරීන් සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්)		වැඩසටහනේ පරමාර්ථය
			දේශීය	විදේශීය	
වැටුප් පරිවර්තනය සම්බන්ධ පුහුණුව	1	දින 02	7,000.00		වැටුප් පරිවර්ථනය පිළිබඳ නිළධාරීන්ගේ විෂය දැනුම පුළුල් කිරීම.
මූලික විමර්ෂණය සම්බන්ධ පුහුණුව	1	දින 02	7,000.00		මූලික විමර්ෂණය පිළිබඳව නිළධාරීන්ගේ විෂය දැනුම පුළුල් කිරීම
දිර්ඝ කාලීන බදු පුහුණු වැඩසටහන	40	දින 01	6,995.00		දිර්ඝ කාලීන බදු සම්බන්දව නිළධාරීන්ගේ විෂය දැනුම පුළුල් කිරීම
සමාජ විද්‍යාව පශ්චාත් උපාධි පාඨමාලාව -එම්.එල්.ඒ.සංජීවමයා (ස.ඉ.කොා)	1	වසර 01	70.000.00		ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව සම්පුර්ණ කලයුතු පාඨමාලාවකි.
කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පාඨමාලාව-ඒ.එල්.අයි.හානු මීය(නි.ඉ.කොා	1	වසර 01	150,000.00		ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව සම්පුර්ණ කලයුතු පාඨමාලාවකි.
MBA in e-Governance පශ්චාත් උපාධි පාඨමාලාව-සමීර හෙට්ටිආරච්චි මයා (ස.ඉ.කොා)- පළමු වාරිකය	1	වසර 02	50,000.00		ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව සම්පුර්ණ කලයුතු පාඨමාලාවකි.
	45		**290,995.00**		

6.3.1. ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකවූ ආකාරය

දැනුම, කුසලතා හා ආකල්පවලින් පරිපූර්ණ කාර්ය මණ්ඩලයක් තුළින් කාර්යක්ෂම සඵලදායි හා ගුණාත්මක මහජන සේවයක් සැපයීම සඳහා වසර පුරාම විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු සංවිධානය කලද, පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ බොහෝ වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

එහෙත් දීර්ඝ කාලීන බදුකර සැකසීමේදී පවතින ගැටළු විසඳා ගැනීමට දීර්ඝ කාලීන බදු සම්බන්ධ පුහුණුව ඉවහල් වූ අතර ආයතන අංශ රාජකාරී විධිමත් කර ගැනීමටද උක්ත පුහුණු වැඩසටහන් වලට නිලධාරීන් සහභාගී කරවීම තුළින් හැකි විය.

7. පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අදාළ නොවන ගිණුම් වර්ග වේ.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.6	වෙනත්	අනුකූල නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	2021.12.13 කොරෝනා වසංගතය හේතුවෙන් විස්තර ලබා ගැනීමට ප්‍රමාද වීම	
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	2021 වර්ෂයේ කොරෝනා වසංගතය හේතුවෙන් ප්‍රමාද වූ බව සඳහන් කළ හැක	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත්	අනුකූල වේ		

	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	කොරෝනා වසංගතය හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු නොපවත්වන ලදී (කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛනට අනුව)	
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	2021.04.27 දින විට මෙම දෙපාර්තමේන්තුවේ පැවති විගණනය කල කමිටුවේදී වාහන වල තත්වය පිළිබඳව සාකච්ජා කල අතර අලුත්වැඩියා කිරීම ඵලදායි නොවන වාහනය (KH 5690) අපහරනය කිරීමසඳහාත් අලුත්වැඩියා කිරීම මගින් රාජකාරී කටයුතු සිදුනිරීම සඳහා	

			යෙදවිය හැකි වාහනය (KH 5694) අලුත්වැඩියා කිරීමත් සිදුකරන ලදී.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ඉඩම් අමාත්‍යාංශයේ සිව්වන මහල ඉදිකිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ		ඉදිරියේ දී සකස් කිරීමට සටහන් කර ඇත.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මෙම සැලැස්ම පිළියෙළ කිරීම සම්බන්ධව නිවරදි අවබෝධයක් නොතිබූ බැවින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර එම ගැටළු නිරාකරණය කර ගැනීමට සිදු වීම	2022මාර්තු අවසන් වීමට පෙර අවසන් කිරීම
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	පසුගිය වර්ෂය තුළ පැවති කොවිඩ් වසංගත තත්වය තුළ පුහුණු අවස්ථා සඳහා තිබූ අවකාශය අඩු වීම	මේ වර්ෂය තුළ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	2021 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්ම සකස් කර අවසන් කර නොතිබීම	2022 මාර්තු අවසන් වීමට පෙර මෙම කාර්යය ඉටු කිරීම
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. PAL/A/LCG/2/2021/11

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 අගෝස්තු 18 දින

ගණන්දීමේ නිලධාරී
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA- 06) හි කාර්යාලීය උපකරණ හා පරිසණක උපකරණ යන වත්කම් හි ආරම්භක ශේෂයන් හා 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA- 06) අවසාන ශේෂයන් අතර රු.129,899 ක වෙනසක් පැවති අතර, එම වෙනසට හේතු ගිණුම් සටහන් මගින් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA- 06) දෙපාර්තමේන්තුවට අයත් පිරිවැය රු.129,715,000 ක වාහන 19 ක් ඇතුළත් කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවට අයත් රත්මල් වැව ගොවිජන සේවා මධ්‍යස්ථානය භාවිතාකරන ට්‍රැක්ටරයක සහ ලුනුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නවතා ඇති ජල බවුසරයක වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA- 06) ඇතුළත් කර නොතිබුණි.

1.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA- 06) ඇතුළත්ව තිබූ පිරිවැය රු.18,507,000 ක වාහන 6 ක් භාවිත කරන කාර්යාලය හෝ ස්ථානය, ලියාපදිංචි පොත් හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

(අ) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අන්තර් පළාත් ගොවි ජනපදවලින් ඉඩම් බදු ආදායම් රැස්කරන අතර, සමාලෝචිත වර්ෂය අවසන්වන විට පැවති රු.84,916,237 ක හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. හිඟ ආදායමෙන් සියයට 53 ක් හෙවත් රු.45,145,773 ක් වසර 2 කට වැඩි කාලයක සිට හිඟව පවතින අතර, සමාලෝචිත වර්ෂයේදී හිඟ ආදායමෙන් අයකරගෙන තිබුණු මුදල රු.5,181,448 ක් පමණක් විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් බදු අය කරනු ලබන ඉඩම්වලට අදාළව බදු ලෙජරයක් පවත්වාගෙන නොයාම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ඉදිරිපත් කර ඇති රු.105,312,901 ක ඉඩම් හා අනෙකුත් බදු කුලී ආදායම සහ රු.මිලියන100 ක් වූ ඇස්තමේන්තුගත ආදායමේ නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය.

(ඇ) දෙබරවැව, මඟියංගනය, මොනරාගල සහ අම්පාර යන අන්තර් පළාත් කාර්යාල 4 න් පමණක් 2020 සහ ඊට පෙර වර්ෂවලට අදාළව රු.20,676,543 ක මගහැරුණු ඉඩම් බදු අදායමක් සමාලෝචිත වර්ෂයේ දී හඳුනාගෙන තිබුණි. ඒ අනුව පෙර වර්ෂවලට අදාළ හිඟ ඉඩම් බදු සම්බන්ධයෙන් නිසි පරිදි වාර්තා පවත්වාගෙන ගොස් නොමැති බව තහවුරු වන අතර සම්පූර්ණ බදු ලෙජරයක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒ.සී.ඒ. 1(i) ආකෘතිය මඟින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාර්තා කර තිබුණු රු.84,916,237 ක හිඟ බදු ආදායමේ නිවැරදිතාවය පිළිබඳ සැහීමට පත්විය නොහැකි විය.

2.2 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයන් 07 ක් සඳහා රු.140,000,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 305 කින් වැඩි වීමකි. වැය විෂයක් සඳහා වෙන් කර තිබුණු රු.2,000,000 ක් සම්පූර්ණයෙන් වියදම්කර නොතිබුණු අතර, ඉතිරි වැය විෂයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණු මුළු මුදල රු.42,555,588 ක් විය. ඒ අනුව ප්‍රතිපාදනයෙන් සියයට 70 ක් හෙවත් රු.97,444,412 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉතිරි වී තිබුණි.

2.3 නීති,රීති,රෙගුලාසි ආදියට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

	නීති රීති රෙගුලාසිය	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i)	XXIV පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.911,533 ක ණය ශේෂය තුළ ඇතුළත්ව තිබුණු වර්ෂ 16 කට පෙර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.19,940 ක් සහ වර්ෂ 1 ත් 2 ත් අතර කාලයකට පෙර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.188,695 ක ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂික මුදල්වලින් හෝ අයකරගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ii)	XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති	වර්ෂ 5 ට වැඩි කාලයක සිට පැවත එන රු.317,735 ක ණය ශේෂ 05 ක් ද ඇතුළුව වැඩ තහනමට ලක් කළ නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.467,229 ක ණය ශේෂ සම්බන්ධයෙන් විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග ක්‍රියාත්මක කිරීමටත් ආයතන සංග්‍රහය ප්‍රකාරව ඇපකරුගෙන් හෝ උරුමක්කාරයින්ගෙන් ණය අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මු.රෙ. 104 (3) හා (4)	පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ විට පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු වුවත්, 2019 හා 2020 වර්ෂවල වාහන 05 කට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට දින 18 ත් මාස 4 ත් අතර කාල පරාසයක් ගතවී තිබුණු අතර ඊට අදාළ පරිපූර්ණ වාර්තා 2022 මාර්තු 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.
(ii)	මු.රෙ. 371 (2)	මු.රෙ. ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය

		අතුරු අග්‍රිමයක් ලබා දිය හැකිවුවත්, සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 15 දින මාණ්ඩලික නිලධාරියෙකු වෙත රු.143,500 ක තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දී තිබූ අතර තත්‍ය වියදම රු. 92,765 ක් වී තිබුණි.
(iii)	මු.රෙ. 371 (5)	අග්‍රිමයක් පියවීම එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු බවත්, අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 11 කදී ලබා දී තිබුණු එකතුව රු.166,364 ක අත්තිකාරම් පියවීමට දින 24 සිට මාස 04 සිට දක්වා කාල පරාසයක් ගතකර තිබුණි.
(ඇ)	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ	
(i)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකට ම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජීම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවට අයත් වාහන 30 ක් සඳහා ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.
(ii)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ ඇමුණුම් 02 ආකෘතිය	චක්‍රලේඛයේ ඇමුණුම 02 මගින් ඉදිරිපත් කර ඇති ආකෘතිය පදනම් කරගෙන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සැලැස්ම පිළියෙල කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(iii)	2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ	
	2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන චක්‍රලේඛයේ 4 වගන්තිය	2018 වර්ෂය සහ ඉන්පසු මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර ක්‍රියාකර නොපමාව නිරවුල් කළ යුතු බව දක්වා ඇතත් සමාලෝචිත වර්ෂය තුළ දී මිය ගිය නිලධාරියෙකුගෙන් සහ විශ්‍රාම ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙළින් රු.232,267 ක සහ රු.911,533 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම්

ගිණුමෙහි ඇතුළත් කර තිබුණි.

(ඇ)	2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 41 වගන්තිය ප්‍රකාරවඅමාත්‍යවරයා සාදන ලද නියෝගයන්හි 6 වන නියෝගය	RTI 03 ආකෘතියට අනුව තොරතුරු අයදුම්පත් ලේඛනයක් පවත්වා ගෙන යායුතු වුවත් දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.4 තැන්පතු

පොදු තැන්පතු ගිණුම් 03 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ට පැවති රු.68,794,932 ක ශේෂයෙහි ඇතුළත් වසර 02 ඉක්මවූ රු.1,138,699 ක තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

(අ) රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු කාර්යක්ෂම කරලීම සඳහා රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-Slims) 2013 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඒ වෙනුවෙන් දරා ඇති පිරිවැය රු.159,456,247 ක් වී තිබුණි. වර්ෂ 07 කට වැඩි කාලයක සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණ ද, අදාළ දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කළ ඉඩම් කැබලි ප්‍රමාණය 1,306,917ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට සැලසුම් කළ ඉඩම් කැබලි 100,000 න් 62,785ක් පමණක් ඇතුළත් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය මගින් ඇතුළත් කළ යුතු ඉඩම් කැබලි සංඛ්‍යාව සහ ඒ සඳහා ගතවන කාලය පිළිබඳව ඇස්තමේන්තුවක් සිදුකර නොමැති බවද වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ආ) රජයේ ඉඩම් බදු දීම තුළින් ආදායම් රැස් කිරීම පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල 09 ක් හා නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල 08 ක් මගින් සිදු කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ දී රැස් කරන ලද ආදායම හා සමාලෝචිත වර්ෂය අවසන්වන විට පැවති හිඟ ඉඩම් බදු ආදායම සම්බන්ධ තොරතුරු (e-Slims) පද්ධතිය මගින් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබුණ ද, අදාළ තොරතුරු එම පද්ධතිය මගින් ලබා ගත නොහැකි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-Slims) මගින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නව දීමනා පත්‍ර 10,000 නිකුත් කිරීම, නව බලපත්‍ර 2000 ක් නිකුත් කිරීම හා දීර්ඝකාලීන බදු බලපත්‍ර 500 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නිකුත් කළ දීමනා පත්‍ර, බලපත්‍ර හා බදුකර සංඛ්‍යාව පිළිවෙළින් 7414 ක් 484 ක් හා 75 ක් වී තිබුණි.

(ඈ) ඉඩම් අමාත්‍යාංශයේ උපදෙස් හා මහ පෙන්වීම යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් රජයේ ඉඩම් තොරතුරු රැස් කිරීමේ දීප ව්‍යාප්ත සංගණනයක් 2020

වර්ෂයේ අවසන් කාර්තුවේ ආරම්භ කර තිබුණු අතර, ඒ සඳහා සංගණන ආකෘති පත්‍ර මිලියන 10 ක් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් නොමිලේ මුද්‍රණය කර දිවයින පුරා ග්‍රාම නිලධාරී වසම් ආවරණය වන පරිදි බෙදා හැර තිබුණි. අදාළ සංගණන කටයුතුවල ප්‍රගතිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ලබාගෙන නොතිබීම හේතුවෙන් මෙම සංගණනයෙන් හඳුනාගත් රජයේ ඉඩම් පිළිබඳ තොරතුරු අනාවරණය කරගත නොහැකිව තිබුණි.

(ඉ) බිම්සවිය ව්‍යාපෘතිය යටතේ දෙපාර්තමේන්තුව විසින් ඉඩම් කච්චේරි පැවැත්වීම, බලපත්‍ර නිකුත් කිරීම, දීමනාපත්‍ර නිකුත් කිරීම, ජංගම සේවා පැවැත්වීම, කොට්ඨාශ දින පැවැත්වීම සහ ගැටලුවලට විසඳුම් සෙවීම යන ක්‍රියාකාරකම් සැලසුම්කර තිබුණු අතර, ඉඩම් කච්චේරි පැවැත්වීම හැර අනෙක් කාර්යයන්හි ප්‍රගතිය සියයට 4 ත් 43 ත් අතර පහළ පරාසයක පැවතුණි.

(ඊ) බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 68 හි ඉඩම් කච්චේරි 20 ක් පැවැත්වීමට සැලසුම් කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක ඉඩම් කච්චේරි 177 ක් පවත්වා තිබුණි. ඒ අනුව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පමණක් පවත්වා තිබුණු කච්චේරි සංඛ්‍යාව 92 ක් වූ අතර එය වාර්ෂික ඉලක්කයට වඩා ඉහළ අගයක් ගෙන තිබුණි. ඒ අනුව පැවැත්විය හැකි ප්‍රශස්ත ඉඩම් කච්චේරි සංඛ්‍යාව පිළිබඳ අවධානය යොමු නොකර ඉතා පහළ ඉලක්කයක සිට සැලසුම් සකස් කර ඇති බව නිරීක්ෂණය විය.

3.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 වර්ෂය දක්වා පිළියෙල කළ කාර්යසාධන වාර්තාව මගින් දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් අයකර ගැනීම හා ඊට අදාළ නීත්‍යානුකූල පියවර ගැනීම සහ රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරු කිරීම යන උපාය මාර්ග පිළිබඳ ඇස්තමේන්තුගත ඉලක්ක හා ප්‍රගති පිළිබඳ තොරතුරු ඇතුළත්කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ කාර්යසාධන වාර්තාවෙහි එම ඉලක්ක සහ ප්‍රගතිය ඇතුළත්කර නොතිබුණි. ඒ අනුව හිඟ ආදායම් අයකර ගැනීම, අනවසර අත්පත්කර ගැනීම් සම්බන්ධයෙන් පියවර ගැනීම සහ ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී මේස පරිගණක 400 ක් මිලදී ගැනීමට සැලසුම්කර තිබුණද, අංක 21/1596/134 දරන 2021 අගෝස්තු 30 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මිලදී ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බව අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් දැනුම් දී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති ප්‍රමාදය හේතුවෙන් සැලසුම් සපුරා ගැනීමට නොහැකි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 18 දින පළ කළ පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද රු.79,218 ක මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී e-Slims ව්‍යාපෘතිය යටතේ තාක්ෂණික උපකරණ මිල දී ගැනීම සඳහා වෙන්කළ රු.මිලියන 55.92 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති ප්‍රමාදය හේතුවෙන් උපයෝජනය කිරීමට අපොහොසත් වී තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

(අ) 2016 වර්ෂයේදී මිලට ගනු ලැබූ මුළු වටිනාකම රු.221,065 ක් වූ ටැබ් යන්ත්‍ර 01 ක්, අඟල් 40 LED රූපවාහිනී යන්ත්‍ර 01ක් හා සංඛ්‍යාංක බහු මාධ්‍ය ප්‍රොජෙක්ටරයක් 2022 මාර්තු 31 දින වන විටත් අභාවිතව ගබඩාවේ රඳවා තිබුණි.

(ආ) දෙපාර්තුමේන්තුව සතු වාහන 05 ක් වර්ෂ 4 ත් 7 ත් අතර කාලයක සිට දෙපාර්තමේන්තු පරිශ්‍රයේ රඳවා තිබුණු අතර එම වාහන අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4 පාඩු හා හානි

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන සිදුවී තිබුණු වාහන 06 ක අනතුරු සම්බන්ධයෙන් එකතුව රු.1,988,262 ක් වූ අලාභයෙන් රු.1,079,050 ක් අයකර ගැනීමට හෝ පොත්වලින් ලියා හැරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 23 දින අංක PD-6509 දරන වාහනයට සිදුව තිබුණු අනතුර මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි.

(ඇ) වර්ෂ 2015 ත් 2019 අතර කාලපරිච්ඡේදය තුළ වාහන අනතුරුවලින් සිදු වූ එකතුව රු.2,399,395 ක හානි වෙනුවෙන් රක්ෂණ සංස්ථාවෙන් රු.1,592,872ක් ද, වගකිවයුතු නිලධාරීන්ගෙන් රු.54,887ක් ද, අයකර ගෙන තිබුණු අතර ඉතිරි රු.700,813 ක හානි සම්බන්ධයෙන් මු.රෙ. 109 පරිදි අස්කිරීමේ නියෝග ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) රජයේ ඉඩම් කළමනාකරණ කටයුතුවලදී ඒකාබද්ධව කටයුතු කරන රාජ්‍ය ආයතන වන ජනාධිපති ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පරිසර අධිකාරිය, තක්සේරු දෙපාර්තමේන්තුව යනාදී රාජ්‍ය ආයතන සමග කටයුතු සිදු කිරීමට සහ ඊ - රාජ්‍ය සංකල්පය අනුව රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියේ (e-Slims) කාර්යයන් සිදු කිරීමට ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය (LGN2.0) යොදාගනු ලබන බව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 1/21/ LGN 2.0 දරන 2018 පෙබරවාරි 21 දිනැති ලිපිය මගින් විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා තිබුණ ද, එම කටයුතු සඳහා ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය භාවිතා නොකිරීම හේතුවෙන් ඊ - රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව දායක වී නොමැති බව නිරීක්ෂණය විය. තව ද, අන්තර්ජාල සේවා ලබා ගැනීම වෙනුවෙන් සන්නිවේදන සමාගම් දෙකකට සමාලෝචිත වර්ෂයේ දී රු.5,368,856 ක වියදමක් දෙපාර්තමේන්තුව දරා තිබුණු අතර LGN2.0 දෙපාර්තමේන්තුව වෙත අන්තර්ජාල පහසුකම් සැපයීම වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනය විසින් රු.448,586 ක පිරිවැයක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ඉඩම් අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව අනුව ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 20 ක් පමණ වන රජයේ ඉඩම් සම්බන්ධ සෘජු වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බව හඳුනාගෙන තිබුණු අතර එම ඉඩම්වලට අදාළව, 1931

වර්ෂයේ දෙපාර්තමේන්තුව පිහිට වූ දින සිට සිදුකරන ලද ඉඩම් බැහැර කිරීම් ඇතුළත් කරමින් සකස්කරන ලද ඉඩම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) අංක KR-6496 දරන වාහනයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මු.රෙ. 104(4) ප්‍රකාරව "අලාභයන් පිළිබඳ අවසන් වාර්තා සකස් කිරීමට පත් කළ කමිටුවේ" නිර්දේශ අනුව රජයට සිදු වූ රු.338,755 ක අලාභයෙන් සියයට 15 ක් හෙවත් රු.50,813 ක් රියදුරුගෙන් අයකරගැනීමට තීරණය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාළ මුදල් අයකරගෙන නොතිබුණි.

4 තිරසර සංවර්ධනය

සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව මගින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ලෙස ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම දක්වා ඇතත්, දෙපාර්තමේන්තුව සහ පළාත් සභා මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය වෙන්කර දක්වා නොතිබීම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට දෙපාර්තමේන්තුවේ දායකත්වය ඇගයීමට නොහැකි වී තිබුණි.

5 කාර්ය මණ්ඩල කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	53	35	18
තෘතියික	38	5	33
ද්විතීක	678	488	190
ප්‍රාථමික	140	92	48
එකතුව	909	620	289

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක්ද ඇතුළුව පුරප්පාඩු 289 ක් පැවති අතර එම තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට හෝ සේවා අවශ්‍යතාවය මත අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

ආර්.එම්. රත්නායක
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ආර්.එම්. රත්නායක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය